# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

**මුදල් අමාත්‍යාංශය**

සමෘද්ධි , ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌණ උපයෝජන

රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

**நிதி அமைச்சு**

**சமுர்த்தி, வதிவிடப் பொருளாதார, நுண்நிதிய, சுயதொழில், வியாபார அபிவிருத்தி மற்றும் கீழுழைப்பு பயன்பாட்டு அரச வளங்கள் அபிவிருத்தி இராஜாங்க அமைச்சு**

Ministry of Finance

State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment, Business Development and Underutilized State Resources Development


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/02/08 | ඔබේ අංකය / உமது இல / Your No: ........ | දිනය / திகதி / Date: 2021.01.07 |

සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු / බැංකු සමිති කළමණාකරුවන්,

සමෘද්ධි බැංකු පාලක මණ්ඩල/ බැංකු සමිති විධායක කමිටු සභාපතිවරුන්.

**<u>අවිධිමත් ක්ෂුද්‍ර මූල්‍ය ආයතන මගින් ණය මුදල් ලබාගෙන, ආපසු ගෙවීමට නොහැකිවී දැඩි අපහසුතාවයන්ට ලක්වූ සමෘද්ධි බැංකු සාමාජිකයන් පිළිබඳ තොරතුරු රැස් කිරීම.</u>**

සමෘද්ධි බැංකුවල සාමාජිකයින් වන, සමෘද්ධිලාභින් ඇතුළු අඩු ආදායම්ලාභින් විසින් සමෘද්ධි බැංකුව මගින් සලසනු ලබන ණය පහසුකම් ඇතුළු වෙනත් සේවාවන් ලබාගන්නා අතර, වෙනත් අවිධිමත් ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් සලසන ආයතන වලින්ද ණය මුදල් ලබාගෙන ඇති බවට වාර්තා වී ඇත.

02. එම ණය මුදල් දෛනිකව සතිපතා හෝ මාසිකව ගෙවීමේ පොරොන්දුව මත, දැඩි ඇපකර සුරැකුම් මත ව්‍යාපාරික කටයුතුවලට මෙන්ම, පාරිභෝගික අවශ්‍යතා වෙනුවෙන්ද, ඉහල ණය පොලී අනුපාතයන් යටතේ ණය මුදල් ලබාගෙන, ආපසු ගෙවීමට නොහැකි වීමෙන් සියදිවි නසා ගැනීම් හෝ දැඩි මානසික/ කායික රෝගී තත්ත්වයන්ට මෙන්ම සාමාජීය ගැටුම් තත්ත්වයන්ට පත් වී ඇති බව වාර්තා වේ. මේ හේතුව නිසා පවුල් සවිබලගැන්වීමට අපහසුතාවයක් පැන නැගී ඇත.

03. මෙම ගැටළුවට පිළියම් සොයා බලා විසඳුමක් සැලසීම පිළිබඳ අප අමාත්‍යාංශයේ අවධානය යොමුවී ඇත. එබැවින් අපගේ ඉලක්කගත ජනතාව අතරින් මෙම ගැටළුවට මුහුණ දී ඇති පිරිස් පිළිබඳ තොරතුරු රැස් කිරීමට අප වෙත දැනුම් දී ඇත.

04. එබැවින් ඔබ සමෘද්ධි බැංකුවේ සාමාජිකත්වය ලබාගෙන ඇති, අවිධිමත් ක්ෂුද්‍ර මූල්‍ය ආයතන මගින් ලබාගත් ණය මුදල් ආපසු ගෙවීමට නොහැකි වී දැඩි පීඩනයට සහ අපහසුතාවයට පත් වී ඇති පිරිස් පිළිබඳ තොරතුරු රැස් කිරීම සඳහා ඇමුණුම් - 01 හි සඳහන් තොරතුරු පත්‍රිකාව භාවිතා කර ක්ෂේත්‍ර භාර සමෘද්ධි සංවර්ධන නිලධාරින් හා ප්‍රජාමූල සංවිධාන නිලධාරීන් විසින් නිවැරදිව හා සම්පූර්ණ තොරතුරු රැස් කරන ලෙස කාරුණිකව දන්වමි.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

05.  එම තොරතුරු සාරාංශගත කර, 2021.02.03 දිනට පෙර සමෘද්ධි බැංකු සමිතිය හරහා දිස්ත්‍රික් සමෘද්ධි අංශයට යොමු කරන ලෙසත්, දිස්ත්‍රික් සමෘද්ධි අංශය විසින් තම සියළු බැංකු වලට අදාල තොරතුරු ඇමුණුම් - 02 අනුව සකස් කර 2021.02.15 දිනට පෙර samurdhibank@gov.lk විද්‍යුත් ලිපිනය හරහා ක්ෂුද්‍ර මුල්‍ය අංශයට එවන ලෙස වැඩිදුරටත් දන්වමි.

06.  අවශ්‍ය කරන තොරතුරු රැස් කිරිමේ පත්‍රිකා බැංකු මඟින් සපයා ගත යුතු අතර, දැනට නිරෝධායන ඇඳිරි නීතිය සහ සංචරණ සීමාවන් පනවා ඇති ප්‍රදේශවල සිටින සාමාජිකයින්ගේ තොරතුරු ආපදා තත්ත්වය පහව ගිය පසුව රැස් කිරීම සිදු කරන ලෙසත් දන්වමි.

07.  මෙම කාර්යය ඉතා වැදගත් සහ ප්‍රමුඛතාවය දී සිදු කිරීමට ඔබ සැමගේ සහාය අපේක්ෂා කරන බවත් කාරුණිකව දන්වමි.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්.

01. ලේකම්, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මුල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය. - කා.දැ.ස
02. අධ්‍යක්ෂ ක්ෂුද්‍රමුල්‍ය සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.
03. අධ්‍යක්ෂ ප්‍රජාමුල සංවිධාන, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.
04. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් /දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල්වරුන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - කා.දැ.ස හා අ.ක.ස.
05. සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරු, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - කා.දැ.ස හා අ.ක.ස.
06. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් ,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - කා.දැ.ස. හා අ.ක.ස.
07. නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - කා.දැ.ස හා අ.ක.ස.